(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 113.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2021 නොවැම්බර් 20 සෙනසුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

731/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන බවත්;

(ii) අනුරාධපුරය හා පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවල පවතින වියළි කාලගුණය අවසන්ව නැවත වැසි ලැබීමත් සමග මදුරු ගහනය වර්ධනය වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මේ වනතෙක් ඩෙංගු රෝගයට ගොදුරුවූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඩෙංගු මදුරු කීටයන් විනාශ කිරීමට 2008/2009 වකවානුවේදී එවකට පැවති රජය විසින් B.T.I. බැක්ටීරියාව කියුබාවෙන් ආනයනය කිරීමට විවිධ උත්සාහයන් ගත් නමුත් එය අසාර්ථක වූ බවත් එතුමා දන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කර තිබේද;

(ii) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට හැකියාවක් නොමැති නම්, එයට හේතු කවරේද;

(iii) B.T.I. බැක්ටීරියාව වෙනුවට ඩෙංගු මදුරුවන් මර්දනයට භාවිතා කළ හැකි විකල්පය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

933/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්ක පහ තුළ සිටින විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සිසුන්ගේ විශේෂ අවශ්‍යතා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සිසුන් සඳහා මේ වනවිට පාසල්වල පවතින භෞතික සම්පත් සහ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බවත් එතුමා දන්නෙහිද?

(ඇ) උතුරු පළාතට අයත් අධ්‍යාපන කලාප 12 සඳහා විශේෂ අවශ්‍යතා සහිත සිසුන් වෙනුවෙන් එක් අධ්‍යාපන කලාපයකට එක් ගොඩනැගිල්ලක් බැගින් නවීන පහසුකම් සහිත ගොඩනැගිලි ඉදිකිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1102/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුළු අපනයන බෝග වගාකරුවන් අතර ශ්‍රී ලංකාවට වැඩි වශයෙන් විදේශ විනිමය උපයා දෙනු ලබන කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් වගාකරුවන් සිටින බවත්;

(ii) කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් යන සුළු අපනයන බෝගවල ගැනුම් මිල පහත වැටෙන අවස්ථාවලදී එම වගාකරුවන්ට අසාධාරණයක් සිදු වන බවත්;

(iii) ගැනුම් මිල පහත වැටෙන අවස්ථාවලදී, කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් වගාකරුවන් එම සුළු අපනයන බෝග වගා කිරීමෙන් ඉවත් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගැනුම් මිල පහත වැටෙන අවස්ථාවලදී, කරදමුංගු, කරාබු නැටි සහ ගම්මිරිස් වගාකරුවන් සඳහා සහනාධාර මුදලක් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2031/2021

ගරු තිස්ස අත්තනායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමියගෙන්ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වැටුප් ක්‍රමය 2018.10.01 වන දින සිට එම මණ්ඩලයේ සමස්ත සේවක පිරිසෙන් බහුතරයකට පමණක් ක්‍රියාත්මක වන බවත්;

(ii) විධායක සහ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල සේවය කරනු ලබන අනෙකුත් නිලධාරීන් සඳහා 2018.10.01 දින සිට මේ දක්වා ඉහත සඳහන් වැටුප් ක්‍රමය ක්‍රියාත්මක නොවන බවත්;

(iii) ඒ හේතුවෙන් එම නිලධාරීන්ට අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමිය පිළිගන්නෙහිද;

(ආ) (i) විධායක සහ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල නිලධාරීන් සඳහා ඉහත සඳහන් වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම මඟින් ඔවුන්ට සාධාරණයක් ඉටු කිරීමට පියවර ගන්නේද;

(ii) එම නිලධාරීන් සඳහා ඉහත සඳහන් වැටුප් ක්‍රමය 2018.10.01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2177/2021

ගරු ගාමිණී වලේබොඩ මහතා,—වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වැවිලි කර්මාන්ත විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— 2021 නොවැම්බර් 23 අඟහරුවාදා, 24 බදාදා, 25 බ්‍රහස්පතින්දා, 26 සිකුරාදා, 27 සෙනසුරාදා, 29 සඳුදා, 30 අඟහරුවාදා සහ 2021 දෙසැම්බර් 01 බදාදා, 02 බ්‍රහස්පතින්දා, 03 සිකුරාදා, 04 සෙනසුරාදා, 06 සඳුදා, 07 අඟහරුවාදා, 08 බදාදා, 09 බ්‍රහස්පතින්දා, 10 සිකුරාදා "විසර්ජන" (2022) පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" (2022) පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා 2021 නොවැම්බර් 23 අඟහරුවාදා සිට 30 අඟහරුවාදා දක්වා ද, 2021 දෙසැම්බර් 01 බදාදා සිට 09 බ්‍රහස්පතින්දා දක්වා ද, වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 5.30 දක්වා ද විය යුතු ය:

එසේ වුවද, අ. භා. 5.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 (4), (5) සහ (6) ඡේදයන් හි විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, “විසර්ජන” (2022) පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා වෙන් කළ, 2021 දෙසැම්බර් 10 සිකුරාදා පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— වරප්‍රසාද,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2021 අගෝස්තු 06 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

5.

ගරු බුද්ධික පතිරණ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

“ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.”

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත — (හයවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2021 නොවැම්බර් 12) [1].

*2.

කර්මාන්ත අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ නියෝග,— 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 14(1)(ඊ) සහ 15 වගන්ති සමඟ කියවිය යුතු 53 වගන්තිය යටතේ මැණික් සහ ස්වර්ණාභරණ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් කර්මාන්ත සහ සැපයුම් කළමණාකරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 මාර්තු 02 දිනැති අංක 2165/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 53 වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 01 දිනැති අංක 2221/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා,— වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 09 දිනැති අංක 2222/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

සංචාරක අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2)(ඩ) වගන්තිය යටතේ සංචාරක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 සැප්තැම්බර් 08 දිනැති අංක 2192/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ධීවර අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ණඅ) සහ (ණආ) වගන්තිය යටතේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජුනි 03 දිනැති අංක 2126/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ධීවර අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ද) වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 12 දිනැති අංක 2218/64 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අධිකරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(1අ) වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මැයි 03 දිනැති අංක 2226/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2013),— 1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32(1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය යටතේ 2018.02.20 දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික චිත්‍රපට සංස්ථාවේ 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2014),— 1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32(1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය යටතේ 2018.02.20 දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික චිත්‍රපට සංස්ථාවේ 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

ප්‍රවාහන අමාත්‍යතුමිය,— ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2019.06.19 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.02.05 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තා (2013 හා 2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.03.09 දින ඉදිරිපත් කරන ලද 2013.12.31 හා 2014.12.31 දිනයන්ගෙන් අවසන් වූ වර්ෂ සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තා අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2018.10.10 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.06.06 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2016 වර්ෂය සඳහා සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.02.21 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2015 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සැලසිනේ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.02.22 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2016 වර්ෂයේ සැලසිනේ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*20.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2021 ජූලි 08) [1].

*21.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 06 දිනැති අංක 2226/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— 2015 ජනවාරි මස 08 වැනි දින සිට 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන් හි සහ පොලිස් සේවයෙහි සාමාජිකයින්ට සිදු වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම,—

උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2021.01.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමප/21/0105/301/003 හා 2021.02.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇත:—

(අ) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ආ) එම අවසන් වාර්තාවේ පළමුවැනි වෙළුමේ අයිතම අංක 08 හි සඳහන් දූෂණ විරෝධී කමිටුව සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම;

(ඇ) එකී අයිතම අංක 08 හි සඳහන් තීරණ අංක 1 සහ නිර්දේශ අංක 1 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා නිශ්චය කරනු ලබන වෙනත් සුදුසු යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම;

(ඈ) ඉහත කී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පළමුවැනි, දෙවැනි හා තෙවැනි වෙළුම්වල සහ එම අවසන් වාර්තාවේ යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨයේ අයිතම අංක 08 හි සහ අයිතම අංක 09 හි I සිට LXI දක්වා පැමිණිලිවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස එකී තීරණ හා නිර්දේශ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස්පති, අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත යොමු කිරීම; සහ

(ඉ) එකී අවසන් වාර්තාවේ තෙවැනි වෙළුමෙ හි අයිතම අංක 10 යටතේ සඳහන් පැමිණිලිවලට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ඊට අනුකූලව, ඉහත (ඇ) හි සඳහන් පරිදි අංක 2221/54 සහ 2021.04.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කර ඇති හෙයින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ඇතුළත් අයිතම අංක 08 හි තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ලැබීමෙන් පසු සලකා බලනු ලැබීමට යටත්ව එකී අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගන්නා ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ සහ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) අයිතම අංක 08 අත්හැර 09 සහ 10 අයිතමයන් හි ඇතුළත් තීරණ හා නිර්දේශ ඉහත (ඇ) සහ (ඉ) හි සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

23.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

24.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

25.

වයිට් රෝස් පදනම සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

26.

රොෂාන් රණසිංහ ජනසහන පදනම සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.